# ප්‍රසම්පාදන දැන්වීමයි

**සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා**

**කටයුතු අමාත්‍යාංශය.**

## සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභා සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සහ වනිතා කටයුතු අමාත්‍යාංශය ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත සදහා මිළ ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | විධායක ඉංජිනේරු කොට්ඨාශය | වැඩ විස්තරය | ලියාපදිංචි ශ්‍රේණිය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු |
|---|---|---|---|---|
| **HM/2011/01** | පැල්මඩුල්ල | ගොඩකවෙල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම දෙවන අදියර | C 8 | රු.2,000.00 |
| **HM/2011/02** | පැල්මඩුල්ල | කහවත්ත මූලික රෝහලේ මායිම් තාප්පය ඉදිකිරීම | C 9 | රු. 1,500.00 |
| **HM/2011/03** | රත්නපුර | හැරමිටිපාන සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සිවිලිම අළුත්වැඩියා කිරීම හා ආරක්ෂිත වැට ඉදිකිරීම. | C 10 | රු. 1,000.00 |
| **HM/2011/04** | දෙහිඕවිට | මත්තමගොඩ තලෝවිට සායන මධ්‍යස්ථානය ඉදිකිරීම | C 8 | රු.2,000.00 |

**02.** සබරගමුව පළාත් සභාවේ හෝ ඉදි කිරීම් කර්මාන්ත පුහුණු හා සංවර්ධන ආයතනයේ ගොඩනැගිලි විෂය යටතේ ඉහත සඳහන් වටිනාකමට හෝ ඊට වැඩි වටිනාකමට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ ටෙන්ඩර් අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

03. 2011 මාර්තු මස 28 දින සිට අප්‍රේල් මස 17 දින දක්වා, සතියේ වැඩ කරන දින වල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා මෙම කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවීමෙන් ප්‍රසම්පාදන ලේඛණ ලබා ගත හැකිය.

04. සියලුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් කොන්දේසිවලට අනුකූලව ලංසු/ තැම්පතු මුදලක් වෙනුවෙන් ලබා ගත් ලියවිලි වල මුල් පිටපත් ටෙන්ඩර් ලියවිලි සමඟ ඉදිරිපත් කළ යුතු අතර සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලේඛන 2011. අප්‍රේල් මස 18 දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අමාතයාංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. සෑම ටෙන්ඩරයක් සඳහාම අනුපිටපතක් ඒ බව කවරයේ සඳහන් කරමින් වෙනම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

05. 2011.04.18 දින පෙ.ව. 10.15 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

06. මෙම ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් කාර්යාල වේලාවන් තුලදී අවශ්‍ය විස්තර අමාත්‍යාංශ කාර්යාලයෙන් ලබා ගත හැකි අතර සාර්ථක ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කෙරුණු ඇත. ටෙන්ඩර්පත් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

07. මෙම දැන්වීම අන්තර්ජාලයේ www.sg.gov.lk ලිපිනයෙන් ද ලබා ගත හැකිය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සහ වනිතා
කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර

2011 මාර්තු මස **25**

දුක.අ. – 045 - 2222542